(01)

වගා ආධාර චක්‍රලේඛ අංක 10.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක. 349, ගාලු පාර,
කොළඹ 03.
1989.01. 18 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

මාතෘකාව - නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ අත්තිකාරම් ගෙවීම

1:0 චක්‍රලේඛයේ පරමාර්ථය:

1:1 තේ නැවත වගා කිරීමේදී ක්ෂේත්‍ර කටයුතු වෙනුවෙන් වත්මන් මිළ ගණන් අනුව විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. අධිකාරිය මගින් ගෙවනු ලබන සහනාධාර මුදල එම වියදමින් කොටසක් වශයෙන් යොදාගත හැකි වුවද, එයද ගෙවනුයේ එක් එක් කාර්යයන් නිම කළ පසුවය. ඒ අනුව මූල්‍යමය අපහසුතා නිසා වගා කටයුතු ආරම්භ කිරීමට පසුබා සිටින කුඩා තේ ඉඩම් හිමියන් දිරිමත් කිරීමක් වශයෙන් නැවත වගා සහනාධාරය අත්තිකාරම් මුදලක් වශයෙන් ගෙවීමට මෙම චක්‍රලේඛය මගින් ඉඩකඩ සැලසේ.

2:0 ක්‍රියා මාර්ගය:

1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතේ 22 වන වගන්තිය යටතේ 1987.12.29 දිනැති අංක 486/9 දරන ගැසට් නිවේදනය මගින් තේ නැවත වගා සහනාධාර වාරිකවලින් අත්තිකාරම් ගෙවීම පිළිබඳව වැවිලි කර්මාන්ත ගරු ඇමතිතුමා විසින් අනුමත කරන ලද නියෝග ප්‍රකාශයට පත්කොට ඇත.

ඒ අනුව මේ සඳහා පහත දැක්වෙන පරිදි ක්‍රියා කළ යුතුය.

2:1 (අ) මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක වීමත් සමග නැවත වගා සහනාධාර ක්‍රමය දෙආකාරයකින් ක්‍රියාත්මක වනු ඇත.

(1) සාමාන්‍ය සහනාධාර ගෙවීමේ ක්‍රමය
(11) සහනාධාර අත්තිකාරම් ගෙවීමේ ක්‍රමය

(ආ) සාමාන්‍ය සහනාධාර ගෙවීමේ ක්‍රමයට අතිරේක වශයෙන් සහනාධාර අත්තිකාරම් ගෙවීමේ ක්‍රමය ක්‍රියාත්මක වේ. එසේ වුවද සහනාධාර අත්තිකාරම් ගෙවිය යුත්තේ ඉඩමේ මුළු බිම් ප්‍රමාණය නොසලකා හෙක්ටාර් දෙකක් (02) හෝ ඊට වඩා අඩු බිම් ප්‍රමාණයක් සඳහා නිකුත් කර ඇති නැවත වගා අවසර පත්‍ර වෙනුවෙනි.

(ඇ) සහනාධාර අත්තිකාරම් ඉල්ලුම් පත්‍රය සහ අත්තිකාරම් ගෙවන ආකාරය පිළිවෙලින් අංක 1 සහ අංක 2 උප ලේඛනවල දැක්වේ. ඒ අනුව නැවත වගා ඉල්ලුම් පත්‍ර නිකුත් කරන අවස්ථාවේදී ඉහත සඳහන් උප ලේඛනද ඉල්ලුම් පත්‍ර කට්ටලයට අමුණා නිකුත් කළ යුතුය.

/ .. 02

(ඇ) එකම ඉඩමක හෙක්: 02 ක් හෝ ඊට වඩා අඩු බිම් ප්‍රමාණයක් වෙනුවෙන් නිකුත් කරන නැවත වගා අවසර පත්‍ර කීපයක් යටතේ වුවද අත්තිකාරම් ගෙවීම අංක 3 උප ලේඛනය පරිදි අනුමත කළ හැකිය. එහෙත් පළමු අවසර පත්‍රය යටතේ අත්තිකාරම් ලබා පස සාරවත් කිරීමට [illegible] සිදුවා අවසන් කර ඇත්නම් පමණක් දෙවැනි අවසර පත්‍රය යටතේ ප්‍රථම අත්තිකාරම් වාරිකය ගෙවීමට පුළුවන. (එහෙත් දෙවැනි අවසර පත්‍රය යටතේ එකී අවස්ථාව දක්වා වගා කටයුතු කර නොමැති නම්, එම අවස්ථාව වන තෙක් සාර්ථකව කරන ලද වැඩ කොටස් වෙනුවෙන් අත්තිකාරම් ගෙවීමකින් තොරව සාමාන්‍ය ක්‍රමය යටතේ සහනාධාර ගෙවීම කළ හැකිය.)

2:2 නැවත වගා ආධාර ක්‍රමය සඳහා භාවිත කරනු ලබන පහත දැක්වෙන ආකෘති පත්‍ර හැරුණු විට දැනට භාවිත කරන අනෙකුත් සියලුම ආකෘති පත්‍ර අත්තිකාරම් ගෙවීමේ ක්‍රමය සඳහාද භාවිත කළ හැකිය. සංශෝධිත ආකෘති පත්‍ර පමණක් අදාළ සංශෝධනයන්ද සහිතව පහත දැක්වේ.

| ආකෘති පත්‍ර අංකය සහ එහි නම | | සංශෝධනය |
|---|---|---|
| 1. ආර්.පී.6 ඒ,බී | – අවසර පත්‍ර ආවරණ ලිපිය සහ ප්‍රකාශනය | අංක 3 දරන උපලේඛනයේ දැක්වේ. |
| 2. ආර්.පී. 11 | – වවුචරය | 'අත්තිකාරම් ගෙවීම' යන්න ආකෘති පත්‍රයේ ඉහළින් සඳහන් කිරීම. |
| 3. ආර්.පී. 12 | – මුදල් ගෙවීමේ ආවරණ ලිපිය | අංක 4 දරන උපලේඛනයේ දැක්වේ. |
| 4. ආර්.පී. 13 | – දර්ශක පත්‍රය | දර්ශක පත්‍රයේ අදාල ගෙවීම් සටහන් කොට එය ඉදිරියෙන් " * " ලකුණ යොදා එම තීරුවට ඉහළින් "අත්ති" හෝ " Adv." යනුවෙන් සඳහන් කරන්න. |

2:3 (අ) දැනටමත් අවසර පත්‍රයක් හිමි තැනැත්තෙකු විසින් යම් ආධාර මුදලක් ලබාගෙන තිබුණද යථෝක්ත ආකෘතිය මගින් ඉල්ලීමක් කළ විට එම අවස්ථාවේ සිට ඉදිරියට ගෙවීමට ඇති මුදල් අත්තිකාරම් වශයෙන් ගෙවීමට පුළුවන. එවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් අංක 3 ඒ උපලේඛනය පරිදි අනුමත කිරීමට පුළුවන.

(ආ) එසේත් සහනාධාර මුදලින් අත්තිකාරම් ගෙවීමේ ක්‍රමය යටතේ අවසරපත්‍රයක උපරිම බිම් ප්‍රමාණය හෙක්. 04 ක් විය යුතුය.

2:4 අත්තිකාරම් ගෙවීමේ ක්‍රමයට අදාලවද දැනට තේ නැවත වගා ආධාර ක්‍රමය පිළිබඳව වාර්තා තබාගන්නා ආකාරයටම වෙනම වාර්තා තබා ගතයුතු අතර, එම වාර්තා මාසිකව කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

වී.කේ. නානායක්කාර
සභාපති.

පිටපත්:-
1. සාමාන්‍යාධිකාරී
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
3. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
4. ක්‍රම සම්පාදන නිලධාරී
5. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී
6. අභ්‍යන්තර විගණක
7. සියලුම කම්හල් අධිකාරීන්
8. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්.

වගා/පොදු-11

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
| --- |
| අවසර පත්‍ර අංකය: |
| අවසර දුන් බිම් ප්‍රමාණය: |

වගා ආධාර චක්‍රලේඛ අංක 10 සඳහා
උපලේඛනය - අංක 01

තුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

තේ නැවත/*අලුතින් වගාකිරීමේ සහනාධාර ක්‍රමය යටතේ
සහනාධාර මුදලින් අත්තිකාරම් ඉල්ලීම.

(1) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම:

(2) ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය:

(3) තේ වගා කිරීමට අදහස් කරන ඉඩමේ නම:

(4) ඉල්ලුම්කරුගේ ලිපිනය:

(5) සහනාධාර ඉල්ලුම් පත්‍රයේ සඳහන් අනු අංකය:
(සහනාධාර ඉල්ලුම් පත්‍රයේ ඉහළ කෙළවරේ මුද්‍රණය කර ඇති අනු අංකය සඳහන් කරන්න.)

(6) නැවත/*අලුතින් වගා කිරීමට අවසර ඉල්ලන බිම් ප්‍රමාණය: අක්: රූ. පර්: (හෙක්ටාර්)

අංක 121/7 සහ 1981 ජනවාරි 01 දිනැති ගැසට් පත්‍රයේ 1980 තුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (තේ වගා කිරීමේ) සහනාධාර නියෝග යටතේ සහ එහි කලින් කලට කරන ලද සංශෝධනවල පරිදි ඉහත සඳහන් ඉඩමේ තේ වගා කිරීම සඳහා ඉහතකී අවසර පත්‍රය යටතේ තේ වගා කිරීමට අවසර දෙන බිම් ප්‍රමාණය වෙනුවෙන් නියමිත සහනාධාර මුදල තුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නීතිරීතිවලට අනුකූලව අත්තිකාරම් වශයෙන් ලබා ගැනීම පිණිස මෙයින් ඉල්ලුම් කරමි.

තත් කාර්යය සඳහා ඉදිරිපත් කරනු ලබන මෙම ඉල්ලුම් පත්‍රයෙහි ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

තවද, තේ වගා කිරීම පිළිබඳව තුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නීතිරීතිවලට මා එකඟවන බවත්, මෙම අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් අපේක්ෂිත කාර්යයන් නොපිරිහෙලා ඉටු කිරීමට මා බැඳී සිටින බවත්, එසේ කිරීමට අපොහොසත් වුවහොත් අත්තිකාරම් ලැබීමට මා නුසුදුස්සකු වන බවත්, ඒ අවස්ථාව වීන විට මවිසින් ලබාගෙන ඇති සියලුම මුදල් තුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් නියම කරනු ලබන පරිදි එම අධිකාරිය වෙත ආපසු ගෙවීමට බැඳී සිටින බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

දිනය:

රූ.1/= ක මුද්දරය මත
ඉල්ලුම්කරුගේ අත්සන.

/ ... 2

---

ඉඩමේ වගා කටයුතු කරගෙන යාම සඳහා තේ නැවත වගා හෝ අලුත් වගා සහනාධාර ක්‍රමය යටතේ අත්තිකාරම් මුදලක් ලබා ගැනීමට ඔබ කැමති නම්, මෙම ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කොට සහනාධාර ඉල්ලුම් පත සමග අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයට එවන්න. අත්තිකාරම් ගෙවන පිළිවෙල මෙසට අමුණා ඇත. අත්තිකාරම් ගෙවනු ලබන්නේ හෙක්ටාර් 02 කට අඩු නැවත වගා අවසර පත්‍ර වෙනුවෙන් පමණකි.

..............................................................

.............. හි පදිංචි ...............................................

මහතා/මහත්මිය/මෙනෙවිය විසින් ඉහත දැක්වෙන ප්‍රකාශය කියවා බලා 198......

...... දින මා ඉදිරිපිට දිවුරා අත්සන් කරන ලදි.

සමාදාන විනිශ්චයකාර රතු තගේ අත්සන:

නිල මුද්‍රාව:

නම :

සාක්ෂි: (1). අත්සන:

නම:

ලිපිනය:

දිනය:

ස්ථානය:

(2). අත්සන:

නම:

ලිපිනය:

දිනය:

ස්ථානය:

සටහන්: 1. මෙම ආකෘතිය සම්පූර්ණයෙන්ම පිරවිය යුතුය. යම්කිසි කරුණක් අදාල නොවේ නම්, ඒ බව සඳහන් කළ යුතුය.

2. *අදාළ නොවන වචන කපා දමන්න.

| |
|---|
| **අවවාදයයි.**<br>ව්‍යාජ දිවුරුම් ප්‍රකාශයක් යැවීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ සිර දඬුවම් ලැබිය හැකි වරදකි. |

ජ/12/23